චක්‍රලේඛ අංක 10/2006 II


මගේ අංකය
எனது இல.
My No. } එම /19/17 විවිධ

ඔබේ අංකය
உமது இல.
Your No. }

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos. } 2393071
2393072

ෆැක්ස් අංකය
பெக்ஸ் இல.
Fax No. } 2393074

ඊමේල්
ஈ - மெயில்
E-mail } rgdept @ sltnet. lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR — GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය
த. பெ. இல.
P. O. Box No. } 565

280, මෙළින් විදිය,
කොළඹ 11.
280, பிரதான வீதி,
கொழும்பு 11.
280, Main Street,
Colombo 11.


දිනය/ திகதி/ Date 2006.09.05

සියළුම විවාහ රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

## විවාහ ලියාපදිංචි කිරීමට උපදෙස්

විවාහ ලියාපදිංචි කිරීමේදී පිළිපැදිය යුතු උපදෙස් සඳහන් කරමින් මවිසින් නිකුත් කර ඇති අංක 01/2001 හා 2001.06.14 දිනැති චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමු කරමි.

02. විවාහ ලියාපදිංචි කිරීමේදී රෙජිස්ට්‍රාර්වරුන් විසින් නිත්‍යානුකූලව අනුගමනය කළ යුතු නීති රීති හා ක්‍රියා මාර්ග පිළිබඳව විවාහ රෙජිස්ට්‍රාර්වරුන් නිරන්තරයෙන්ම දැනුවත් කරන නමුත් සමහර විවාහ රෙජිස්ට්‍රාර්වරුන් එකී උපදෙස් හා නීතිරීති කඩ කරමින් විවාහ ලෙසාසලකා කටයුතු කරන අවස්ථා පිළිබඳව මා වෙත පැමිණිලි ලැබී තිබේ. පහත සඳහන් නීති විරෝධී ක්‍රියා වල සමහර විවාහ රෙජිස්ට්‍රාර්වරුන් නිරත වන බව එකී පැමිණිලි වලින් අනාවරණය වේ.

I. කාර්යාලයෙන් බැහැර විවාහ ලියාපදිංචි කිරීමට භාරගත් විට නියමිත වේලාවට අදාල රෙජිස්ට්‍රාර්වරයා සහභාගී නොවීම.
II. සමහර රෙජිස්ට්‍රාර්වරුන් එකම වේලාවට විවාහ කීපයක් ලියාපදිංචි කිරීමට භාරගැනීම නිසා සමහර විවාහ නියමිත සුභ වේලාවන් අනුව සිදු කිරීමට නොහැකි වීම.
III. ඇතැම් විවාහ රෙජිස්ට්‍රාර්වරුන් විවාහයට අදාල ලියවිලි වලට නියමිත දිනට පෙර පාර්ශ්ව කරුවන්ගේ හා සාක්ෂි කරුවන්ගේ අත්සන් ලබාගැනීමට කටයුතු කිරීම.
IV. සමහර විවාහ සඳහා රෙජිස්ට්‍රාර්වරයා සහභාගී නොවී වෙනත් පුද්ගලයකු ඒ සඳහා යැවීම.
V. බාල වයස් කරුවන්ගේ විවාහ ලියාපදිංචි කිරීම.

03. ඉහත සඳහන් වැරදි බරපතල ලෙස විවාහ ලියාපදිංචි කිරීමේ නීති හා උපදෙස් කඩ කරන අවස්ථාවන් වේ. විවාහ රෙජිස්ට්‍රාර්වරු කාර්යාලයෙන් පිට විවාහ ලියාපදිංචි කිරීමට භාරගැනීමේදී නියමිත වේලාවන්ට අනුව තමන්ට පුද්ගලිකවම සහභාගී විය හැකි විවාහ පමණක් භාරගත යුතුය. විවාහයක් ලියාපදිංචි කිරීමට නිත්‍යානුකූල බලය ඇත්තේ විවාහ රෙජිස්ට්‍රාර්වරයාට පමණක් බැවින් වෙනත් කිසිම පුද්ගලයකු ඒ සඳහා නොයෙදිය යුතුය.

04. විවාහයට අදාල ලියවිලි කල් ඇතිව ලියා තැබීම වරදක් නොවූවත් එම ලේඛන වලට අත්සන් ලබාගත හැක්කේ නියමිත දින පාර්ශ්ව කරුවන් හා සාක්ෂි කරුවන් සියළු දෙනාම එක විට පෙනී සිටින්නේ නම් පමණි. උඩරට හා සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ නීති යටතේ විවාහ ලියාපදිංචි කළ හැකි අවම

වයස අවු. 18 ක් වන බැවින් එම වයසට අඩු වයස්කරුවන්ගේ විවාහ කිසිසේත්ම ලියාපදිංචි නොකළ යුතුය. විශේෂයෙන්ම පාර්ශ්වකරුවන්ගේ වයස තහවුරු කරගැනීමට රෙජිස්ට්‍රාර්වරයා උනන්දුවෙන් කටයුතු කළ යුතුය.

05 විවාහ ලියාපදිංචි කිරීමේදී මෙහි සඳහන් වැරදි වලින් මුළුමනින්ම වැළකී සිටීමට සියළුම විවාහ රෙජිස්ට්‍රාර්වරුන් කටයුතු කළ යුතුය. එවැනි වැරදි සිදු කරන බවට කිසියම් විවාහ රෙජිස්ට්‍රාර්වරයකු විරුද්ධව පැමිණිලි ලැබුනහොත් ඒ පිළිබඳව ඔහුට/ඇයට විරුද්ධව ඉතා තදබල විනය ක්‍රියා මාර්ග ගන්නා බව ද මෙයින් දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :
1. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැනගැනීම සඳහා
2. සියළුම කලාප කාර්යාලයේ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.
3. සියළුම දිස්ත්‍රික් ලේකම් හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස.
4. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - දැ.ගැ.ස.
5. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස.
6. ලේකම්. දිප ව්‍යාප්ත රෙජිස්ට්‍රාර්වරුන්ගේ සංගමය - දැ.ගැ.ස.